චක්‍ර ලේඛ අංක : 13/95

මගේ අංකය: බප/සසේකො/ලේකි.
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත,
03 වන මහල,
මාළිගාවත්ත මහලේකම් කාර්යාලය,
කොළඹ 10.
1995 ජුලි මස 11 දින.

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිතිවල
සභාපතිවරුන් වෙත.

මහත්මයාණෙනි,

<u>විනය පරීක්ෂණ ප්‍රමාද වීම</u>

සමුපකාර සමිතිවල විනය පරීක්ෂණ ක්‍රියාමාර්ග බොහෝදුරට ප්‍රමාදවන බැව් නිතර නිතර අසන්නට ලැබේ. වෘත්තිය සමිති නියෝජිතයින් විසින් ද මේ තත්ත්වය කොමිෂන් සභාව වෙත ඇතැම් අවස්ථාවලදී පෙන්වා දී ඇත. මෙවැනි තත්ත්වයක් පැවැතීම සමිතිවලට මෙන්ම සේවකයින්ට ද බොහෝදුරට අවාසිදායක ය.

02. තවද සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක: 18/73 හා 1973.07.23 දින දරණ චක්‍රලේඛයෙන් විනය පරීක්ෂණ ප්‍රමාදයකින් තොරව කරගෙන යාම පිළිබඳව විධිවිධාන සලසා තිබේ. කොමිෂන් සභාවේ මෙම විධිවිධාන නොතකා ඇතැම් සමුපකාර සමිති ක්‍රියා කරන බැව් පෙනී ගොස් ඇති අතර, විනය පරීක්ෂණවලදී සියලුම චෝදනා වලින් නිදහස් වී සේවකයාට හිඟ වැටුප් ගෙවීමට නියම කර තිබියදීත් එසේ හිඟ වැටුප් නොගෙවන අවස්ථා පිළිබඳව පැමිණිලි ලැබී ඇත.

03. එබැවින් කොමිෂන් සභාවේ රෙගුලාසි හා විධිවිධාන වලට පටහැනිව ක්‍රියාකිරීම හෝ ඒවා උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා වුවහොත්, ඒ පිළිබඳව තදින්ම ක්‍රියා කිරීමට සිදුවන බැව් කොමිෂන් සභාවේ නියමය පිරිදි මෙයින් දැනුම් දෙමි.

මෙයට - විශ්වාසී වූ,

(පී.ඩී. චන්ද්‍රදාස)
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. කෘෂිකර්ම, පළාත් පාලන හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම් - බස්නාහිර පළාත.
3. ස.සං.කො./රෙ.(බ.ප.)
4. සහකාර සමුපකාර සං. කොමසාරිස් කළුතර/ගම්පහ/කොළඹ.
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
6. ප්‍රාදේශීය ලේකම්වරුන්